# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ  அதிவிசேஷமானது  EXTRAORDINARY

අංක 1,010/1 – 1998 ජනවාරි 13 වැනි අඟහරුවාදා – 1998.01.13

1,010/1 ஆம் இலக்கம் — 1998 ஆம் ஆண்டு சனவரி மாதம் 13 ஆம் திகதி செவ்வாய்க்கிழமை

No. 1,010/1 – TUESDAY, JANUARY 13, 1998

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)  (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)  (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 20/50.

අංකය : ඩී/24/ඇල්.ජී.ඇල්/එන්වයි.

### නාවික හමුදා පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝගය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපති.

1997 අගෝස්තු මස 25 වන දින,
කොළඹ දී ය.

### නියෝගය

1993 මාර්තු මස 11 වන දින අංක 757/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 නාවික හමුදා වැටුප් සංග්‍රහය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 2 වන නියෝගයේ –

(i) (3) වන ඡේදයේ (ii) (ආ) අනුඡේදයේ වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් ;–

"(ii) අල්ලස් ගැනීමක් කර ඇතැයි හෝ අනාචාරයක නීතිවිරෝධී ඵල ප්‍රයෝජනයක් ලබා ඇතැයි ; හෝ" ;

(ii) එහි (ii) වන අලුත් අනුඡේදයට අනතුරුව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් ;–

"(iii) සොරකම් කිරීම, කොල්ලකෑම, ගෙවල් බිඳීම, සිවිල් පුද්ගලයන් මත සාපරාධී බලය යෙදීම, ස්ත්‍රී දූෂණය සහ මිනීමැරීම කර ඇතැයි හෝ එවැනි වරදක් කිරීමට තැත් කිරීමක් හෝ සිදුකර ඇති අවස්ථාවක." ;

(2) එහි 22 වන නියෝගයේ –

(4) වන ඡේදයේ (ආ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් ;–

(ආ) යම් නැවියකු

(i) රජයට පාඩුවක් වන අන්දමට, රජයට හෝ නාවික හමුදාවට හෝ අයත් දේපළක් වංචාවෙන් අත්කර ගැනීම හෝ වංචාවක් හෝ හොර අත්සන් තැබීමක් හෝ ඊ හා සමාන වෙනත් වරදක් කර හෝ ඇති බවට, හෝ

(ii) අල්ලස් ගැනීමක් හෝ අනාචාරයක නීති විරෝධී ඵල ප්‍රයෝජනයක් ලබා ඇති බවට ; හෝ

(iii) සොරකම් කිරීම, කොල්ලකෑම, ගෙවල් බිඳීම, සිවිල් පුද්ගලයන් මත සාපරාධී බලය යෙදීම, ස්ත්‍රී දූෂණය සහ මිනීමැරීම කර ඇත්තා වූ හෝ එවැනි වරදක් කිරීමට තැත් කිරීමක් හෝ සිදු කිරීමක් කර ඇත්තා වූ බවට ; හෝ

මුල් බැල්මට පෙනෙන පරිදි ඔප්පු කරනු ලැබ, නාවික කාර්යවල යෙදීම අත්හිටුවනු ලැබූවිට එසේ අත්හිටුවනු ලැබූ දිනයේ සිට ඔහුට කිසිදු හෝ පාරිශ්‍රමිකයක් නොලැබිය යුතු ය. එවැනි සෑම අවස්ථාවක දී ම ගෙවීම අත්හිටුවීමේ නියමය ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතු ය.".

(3) මෙම නියෝගයේ (1) වන සහ (2) වන ඡේදවලින් නාවික හමුදා වැටුප් සංග්‍රහයට කෙරෙන සංශෝධනයන් 1993 මාර්තු මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බලාත්මක වනු ඇත.

12 – 08


සැ.යු.– අති විශෙෂ ගැසට් අංක 1,009/1 කාණ්ඩය අංක 1,009/19න් අවසන් වේ.
கு. க. — 1,009/1 ஆம் இலக்கம் கொண்ட அதிவிசேஷ வர்த்தமானித் தொடரின் இறுதி இல. 1,009/19.
N.B.– *Gazette Extraordinary* Series No. 1,009/1 ends with 1,009/19.
1 A – D 047156 – 1,310 (97/11)